# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සුහුරුපාය, බත්තරමුල්ල

| | | | |
|---|---|---|---|
| තැ.පෙ.අංකය<br>த. பெ.இ<br>Po.Box No | 10120 | ෆැක්ස්<br>தொலைநகல<br>Fax | 011-2171635 |
| දුරකථන<br>தொலைபேசி<br>Telephone | 011-2887973 (HUNTING) | වෙබ්.ලිපිනය<br>இணையதளம்<br>Web Site | www.Police.lk |
| ඊ මේල්<br>மின்னஞ்சல்<br>E-mail | dir.media@police.gov.lk | | |


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இலக்கம்<br>My NO | 1317/ 2024 | ඔබේ අංකය<br>உமது இலக்கம்<br>Your No | / 2024 | දිනය<br>திக<br>Date | 14/08/2024<br>පැය 0540 |

**මාධ්‍ය නිවේදනය**

**ප්‍රධාන කර්තෘ / ප්‍රවෘත්ති කර්තෘ,**
**අධ්‍යක්ෂ ප්‍රවෘත්ති / ප්‍රවෘත්ති කළමණාකරු,**
**සියළුම මාධ්‍ය ආයතන.**

**<u>පොලිස් මාධ්‍ය කොට්ඨාසය වෙත වාර්තා වූ වැදගත් තොරතුරු ජනමාධ්‍ය වෙත යොමු කිරීම.</u>**

**01. හෙරොයින් සහ අයිස් මත්ද්‍රව්‍ය සමග සැකකරුවන් දෙදෙනෙකු හා සැකකාරියක් අත්අඩංගුවට - කළුතර අපරාධ කොට්ඨාසය.**

2024.08.13 වන දින සවස් කාලයේ කඩවත පොලිස් වසමේ මංකඩවල පාර සහ ඉහල බියන්විල ප්‍රදේශවලදී කළුතර අපරාධ කොට්ඨාසයේ නිලධාරීන් විසින් ලද තොරතුරක් මත වැටලීම් තුනක් සිදුකර,

**01. හෙරොයින් ග්‍රෑම් 14 මිලිග්‍රෑම් 700 ක් සහ අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 18 මිලිග්‍රෑම් 430 ක් සන්තකයේ තබාගෙන සිටි සැකකාරියක්,**

**02. හෙරොයින් ග්‍රෑම් 24 මිලිග්‍රෑම් 740 ක් සහ අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 22 මිලිග්‍රෑම් 260 ක් සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු,**

**03. අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 16 ක් සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු**

අත්අඩංගුවට ගෙන කඩවත පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත. **අත්අඩංගුවට ගත් සැකකාරිය වයස අවුරුදු 25 ක් වන ඉහල බියන්විල ප්‍රදේශයේ පදිංචිකාරියක් වන අතර සැකකරුවන් වයස අවුරුදු 27 සහ 29 වයස්වල පසුවන කඩවත සහ මාකොළ ප්‍රදේශවල පදිංචිකරුවන් වේ.**

කඩවත පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**02. කොල්ලකෑමකට සම්බන්ධ සැකකරුවෙකු අයිස් මත්ද්‍රව්‍ය සමඟ අත්අඩංගුවට - බස්නාහිර පළාත දකුණ අපරාධ කොට්ඨාසය.**

2024.08.13 වන දින දහවල් කාලයේදී වැලිකඩ පොලිස් වසමේ අරුණෝදය මාවත ප්‍රදේශයේදී බස්නාහිර පළාත දකුණ අපරාධ කොට්ඨාසයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරු මත 2024.08.12 වන දින වැලිකඩ පොලිස්

වසමේදී ජංගම දුරකථනයක් කොල්ලකෑම සම්බන්ධයෙන් අවශ්‍ය ව සිටි සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇති අතර සැකකරු පරීක්ෂා කිරීමේදී ඔහු සන්තකයේ තිබී **අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 11 මිලිග්‍රෑම් 350 ක්** අත්අඩංගුවට ගෙන වැලිකඩ පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 31 ක් වන රාජගිරිය ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

වැලිකඩ පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**03. දේපල සොරකම් සහ කොල්ලකෑම් කිහිපයකට සම්බන්ධ සැකකරුවෙකු අත්අඩංගුවට - බස්නාහිර පළාත දකුණ අපරාධ කොට්ඨාසය.**

2024.08.13 වන දින දහවල් කාලයේදී වැලිකඩ පොලිස් වසමේ බණ්ඩාරනායකපුර ප්‍රදේශයේදී බස්නාහිර පළාත දකුණ අපරාධ කොට්ඨාසයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත දේපල සොරකම් කිහිපයකට අවශ්‍ය කර සිටි සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත. සැකකරු විසින් **මත්තේගොඩ, රාගම, ගණේමුල්ල හා හෝමාගම පොලිස් වසම්වල සිදුකරන ලද කෝල්ලකෑම් සහ දේපල සොරකම් කිහිපයක් සිදුකර ඇති අතර, රන් ගුලි 03 ක්, කොණ්ඩ කපන මැෂිමක්, කැමරා 02ක්, ලී කපන මැෂිමක්, ඩ්‍රිල් මැෂිමක්, ග්‍රයින්ඩරයක්, කුඩා මැණික් ගල් 03 ක්, සපත්තු ජෝඩුවක් සහ මුදල් රුපියල් 5000/- ක්** පොලිස් භාරයට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 33 ක් වන රාජගිරිය ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

බස්නාහිර පළාත දකුණ අපරාධ කොට්ඨාසය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**04. හෙරොයින් සමඟ සැකකරුවන් දෙදෙනෙකු අත්අඩංගුවට - මීගමුව පොලිස් ස්ථානය.**

2024.08.13 වන දින සවස් කාලයේදී මීගමුව පොලිස් වසමේ කොප්පරා හන්දියේ දී සහ 20 කණුවේදී මීගමුව පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරු මත වැටලීම් දෙකක් සිදුකර **හෙරොයින් ග්‍රෑම් 05 මිලිග්‍රෑම් 340 ක් සහ හෙරොයින් ග්‍රෑම් 05 මිලිග්‍රෑම් 720 ක් සන්තකයේ තබාගෙන සිටි සැකකරුවන් දෙදෙනෙකු** අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරුවන් අවුරුදු 28 සහ 33 වයස් වල පසුවන කොච්චිකඩේ සහ ජාඇල ප්‍රදේශවල පදිංචිකරුවන් වේ.**

මීගමුව පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**05. හෙරොයින් සමග සැකකරුවෙකු අත්අඩංගුවට - ගල්කිස්ස කොට්ඨාස අපරාධ විමර්ශන කාර්යංශය.**

2024.08.13 වන දින සවස් කාලයේ ගල්කිස්ස පොලිස් වසමේ බඩෝවිට ප්‍රදේශයේදී ගල්කිස්ස කොට්ඨාස අපරාධ විමර්ශන කාර්යංශයේ නිලධාරීන් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **හෙරොයින් ග්‍රෑම් 05 මිලිග්‍රෑම් 100 ක් සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන ගල්කිස්ස පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 44 ක් වන බොරලැස්ගමුව ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

ගල්කිස්ස පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**06.** **හෙරොයින් සමඟ සැකකරුවකු අත්අඩංගුවට - අතුරුගිරිය පොලිස් ස්ථානය.**

2024.08.13 වන දින සවස් කාලයේදී අතුරුගිරිය පොලිස් වසමේ පනාගොඩ ප්‍රදේශයේදී අතුරුගිරිය පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරු මත වැටලීමක් සිදුකර **හෙරොයින් ග්‍රෑම් 05 මිලිග්‍රෑම් 300 ක් සන්තකයේ තබාගෙන සිටි සැකකරුවකු** අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 32 ක් වන හෝමාගම ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

අතුරුගිරිය පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**07.** **වාලම්පුරියක් සමග සැකකරුවෙකු අත්අඩංගුවට - දිවුලපිටිය පොලිස් ස්ථානය.**

රුපියල් ලක්ෂ 13 ක මුදලට වාලම්පුරියක් අලෙවි කිරීමට සූදානම්ව සිටින බවට දිවුලපිටිය පොලිස් ස්ථානයේ නිලධාරීන්ට ලද තොරතුරක් මත 2024.08.13 වන දින රාත්‍රී කාලයේදී දිවුලපිටිය නගරයේදී **වාලම්පුරියක් සන්තකයේ තබා ගෙන සිටි සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 42 ක් වූ දෙහිඕවිට ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

දිවුලපිටිය පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**08.** **මෙරට නිෂ්පාදිත ගිනි අවියක් සමග සැකකරුවෙකු අත්අඩංගුවට - නොච්චියාගම පොලිස් ස්ථානය.**

2024.08.13 වන දින දහවල් කාලයේදී නොච්චියාගම පොලිස් වසමේ ඇහැටුගම ප්‍රදේශයේදී නොච්චියාගම පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **මෙරට නිෂ්පාදිත ගිනි අවියක් සහ පතොරොමක් සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 17 ක් වූ මහවැලි හැලඹවැව ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

නොච්චියාගම පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**09.** **ගෝඩා සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - කළුතර උතුර පොලිස් ස්ථානය.**

2024.08.13 වන දින රාත්‍රී කාලයේදී කළුතර උතුර පොලිස් වසමේ දියගම ප්‍රදේශයේදී කළුතර උතුර පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **නීති විරෝධී මත්පැන් පෙරීමට ගන්නා ගෝඩා ලීටර් 1080 ක් සමඟ සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 29 ක් වන ගල්පාත ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

කළුතර උතුර පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**10.** **මාරක රිය අනතුරක් - සාලියවැව පොලිස් වසම.**

2024.08.13 වන දින උදෑසන කාලයේ සාලියවැව පොලිස් වසමේ පුත්තලම ත්‍රිකුණාමලය මාර්ගයේ 17 හන්දිය ආසන්නයේදී අනුරාධපුර දෙස සිට පුත්තලම දෙසට ධාවනය වූ ලොරි රථයක් රියදුරුට පාලනය කරගත නොහැකිව මාර්ගයෙන් ඉවතට පැන මාර්ගය අයිනේ රැඳී සිටි කාන්තාවකගේ ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් එම කාන්තාව තුවාල ලබා අළුත්ගම ප්‍රාදේශීය රෝහලට ඇතුළත් කිරීමෙන් පසු වැඩිදුර ප්‍රතිකාර සඳහා පුත්තලම රෝහලට ඇතුලත් කර ප්‍රතිකාර ලබමින් සිටියදී මියගොස් ඇත.

**මරණකාරිය වයස අවුරුදු 70 ක් වූ 17 කණුව, අළුත්ගම ප්‍රදේශයේ පදිංචිකාරියකි.**

මෘත ශරීරය පුත්තලම රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. සාලියවැව පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**11. මාරක රිය අනතුරක් - තලාතුඔය පොලිස් වසම.**

2024.08.13 වන දින උදෑසන කාලයේ තලාතුඔය පොලිස් වසමේ තැන්නේකුඹුර රාගල මාර්ගයේ මයිලපිටිය ප්‍රදේශයේදී වාහනයක ගැටී පුද්ගලයෙකු මියගොස් ඇති බවට තලාතුඔය පොලිස් ස්ථානය වෙත ලද පණිවිඩයකට අනුව විමර්ශනයක් ආරම්භ කර ඇත.

**මරණකරු වයස අවුරුදු 70 ක් වූ මොරවක ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මරණකරු සිය දියණියගේ නිවසේ සිට නැවත සිය නිවස වෙත යාමට මාර්ගයට පැමිණ සිටියදී මෙලෙස අනතුරට ලක්ව ඇති බවට විමර්ශනයේදී අනාවරණ වී ඇත. අනතුරින් පසු වාහනය පලාගොස් ඇති අතර සැකකරු අත්අඩංගුවට ගැනීම සඳහා තලාතුඔය පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**12. මාරක රිය අනතුරක් - තංගල්ල පොලිස් වසම.**

2024.08.13 වන දින සවස් කාලයේ තංගල්ල පොලිස් වසමේ කොළඹ වැල්ලවාය මාර්ගයේ තංගල්ල රෝහලට හැරෙන හන්දිය ආසන්නයේදී මාතර දෙස සිට කතරගම දෙසට ධාවනය වූ බස් රථයක් මගීන් බැස්සවීම සඳහා නතර කර නැවත ඉදිරියට ධාවනය කිරීමේදී බස් රථයට ඉදිරියෙන් පාර මාරුවීමට ගිය කාන්තාවකගේ ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් එම කාන්තාව තුවාල ලබා තංගල්ල රෝහලට ඇතුලත් කර ප්‍රතිකාර ලබමින් සිටියදී මියගොස් ඇත.

**මරණකාරිය වයස අවුරුදු 41 ක් වූ බෙලිඅත්ත ප්‍රදේශයේ පදිංචිකාරියකි.**

මෘත ශරීරය තංගල්ල රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. තංගල්ල පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**13. මාරක රිය අනතුරක් - කාත්තන්කුඩි පොලිස් වසම.**

2024.08.13 වන දින රාත්‍රී කාලයේ කාත්තන්කුඩි පොලිස් වසමේ මඩකලපුව කල්මුණේ මාර්ගයේ මීරා බාලිකා විද්‍යාලය අසලදී මඩකලපුව දෙස සිට කල්මුණේ දෙසට ධාවනය වූ යතුරු පැදියක් අතුරු මාර්ගයකට හැරවීමට යාමේදී පිටුපසින් පැමිණි යතුරු පැදියක් එම යතුරු පැදියේ බඳෙහි ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් යතුරු පැදිකරුවන් දෙදෙනා සහ පසු පැදිකරුවෙකු තුවාල ලබා ආරියම්පති රෝහලට ඇතුලත් කර ප්‍රතිකාර ලබමින් සිටියදී එක් පැදිකරුවෙකු මියගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 20 ක් වූ වික්ටරි ක්‍රීඩාංගණය පාර, කාත්තන්කුඩි 06 ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීරය ආරියම්පති රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. පසු පැදිකරු වැඩිදුර ප්‍රතිකාර සඳහා මඩකලපුව රෝහල වෙත මාරු කර යවා ඇත. කාත්තන්කුඩි පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**14. මාරක රිය අනතුරක් - අරලගංවිල පොලිස් වසම.**

2024.08.13 වන දින රාත්‍රී කාලයේ අරලගංවිල පොලිස් වසමේ අරලගංවිල මනම්පිටිය මාර්ගයේ මැදගම ප්‍රදේශයේදී මනම්පිටිය දෙස සිට අරලගංවිල දෙසට ධාවනය වූ යතුරු පැදියක් මාර්ගය අයිනේ නවතා තිබූ ලොරි රයක පිටුපස ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් යතුරු පැදිකරු බරපතල තුවාල ලබා මනම්පිටිය රෝහලට ඇතුලත් කිරීමේදී මියගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 49 ක් වූ දේවගල, අරලගංවිල ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීරය මනම්පිටිය රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. ලොරි රථයේ රියදුරු අත්අඩංගුවට ගෙන ඇත. අරලගංවිල පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**